# අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

**අ.පො.ස. ( උ.පෙළ) විභාගය - 2019 සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**කෘෂි විද්‍යාව I** | **8 S I** | **පැය දෙකයි**

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

1. 2017 වර්ෂයේ දී, ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශවලින් ලැබුණු දායකත්වය පිළිවෙලින්,
(1) 8%, 27% හා 56% වේ.
(2) 11%, 37% හා 50% වේ.
(3) 12%, 26% හා 53% වේ.
(4) 15%, 20% හා 65% වේ.
(5) 16%, 37% හා 48% වේ.

2. හරිත විප්ලවය නිසා ඇති වූ **අයහපත්** ප්‍රතිඵලයකි,
(1) ඒකක භූමියක අස්වැන්න අඩු වීම.
(2) බෝගවල ස්වභාවික ප්‍රතිරෝධීතාව වැඩි වීම.
(3) පළිබෝධ හානි වැඩි වීම.
(4) ජෛව විවිධත්වය පරිහානියට පත්වීම.
(5) උසස් අස්වනු ලබා දෙන බෝග ප්‍රභේද බිහි වීම.

3. කාලගුණ මධ්‍යස්ථානයක දිනපතා පෙ.ව. 8.30 ට හා ප.ව 3.30 ට දෙවරක් පාඨාංක ගනු ලබන්නේ,
(1) වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව මැනීමේ දී ය.
(2) සුළඟේ වේගය මැනීමේ දී ය.
(3) වාෂ්පීකරණය මැනීමේ දී ය.
(4) වායුගෝලීය උෂ්ණත්වය මැනීමේ දී ය.
(5) වර්ෂාපතනය මැනීමේ දී ය.

4. වර්ෂාපතනය මැනීම සඳහා එම උපකරණයට අදාළ මිනුම් සරාවක් නොමැති අවස්ථාවක දී, සිලින්ඩරාකාර බඳුනකට එකතු වන ජල ප්‍රමාණය පරිමාවක් ලෙස මැනගෙන උසකට පරිවර්තනය කෙරේ. එවැනි අවස්ථාවක දී ලබා ගන්නා ලද පාඨාංක පහත දැක් වේ.
වර්ෂාමානයේ පුනීල කටෙහි අරය = 7cm
වර්ෂාමානය තුළ එකතු වූ ජල පරිමාව = $30.8cm^3$
මෙහි දී ලැබුණු වර්ෂාපතනය උසක් ලෙස මිලි මීටර්,
(1) 0.2 කි.
(2) 1 කි.
(3) 2 කි.
(4) 10 කි.
(5) 20 කි.

5. ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක් වේ.
A. ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාපවලට බෙදීමේ දී උෂ්ණත්වය හා වාර්ෂික වර්ෂාපතනය පදනම් කර ගනු ලැබේ.
B. ප්‍රධාන දේශගුණික කලාප කෘෂි දේශගුණික කලාපවලට බෙදීමේ දී උච්චත්වය සැලකිල්ලට ගැනේ.
C. ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 46 කට බෙදා ඇත.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) A සහ B පමණි.
(4) A සහ C පමණි.
(5) B සහ C පමණි.

6. අවුරුද්දේ විවිධ කාලවල දී ආලෝක කාලසීමාවේ වෙනසට ශාක දක්වන ප්‍රතිචාරය ප්‍රකාශවර්තීතාව ලෙස හැඳින්වේ. ප්‍රකාශවර්තීතාව සෘජුවම බලපාන්නේ, පහත කවර ශාක කායික ක්‍රියාවලියකට ද ?

(1) ප්‍රභාසංස්ලේෂණය
(2) බීජ ප්‍රරෝහණය
(3) උත්ස්වේදනය
(4) ආකන්ද වර්ධනය
(5) පුෂ්පීකරණය

7. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පසේ අඩංගු ජල ප්‍රමාණය අනුව පසේ සත්‍ය ඝනත්වය වෙනස් වේ.
(2) පසක අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අනුව පසේ සත්‍ය ඝනත්වය වෙනස් වේ.
(3) පසක සත්‍ය ඝනත්වය සැමවිටම දෘෂ්‍ය ඝනත්වයට වඩා වැඩි වේ.
(4) පසක සත්‍ය ඝනත්වය සෙවීම සඳහා, පස් නියැදියක් නියත බරක් ලැබෙන තෙක් 105 $^{O}$C ක උදුනක වියළනු ලැබේ.
(5) බිම් සැකසීමේ දී පසේ සත්‍ය ඝනත්වය අඩු වේ.

8. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මෙන්ම තෙත් කලාපයෙහි ද දක්නට ලැබෙන පස් කාණ්ඩයකි,

(1) රතු දුඹුරු පස.
(2) රතු කහ ලැටසෝල් පස.
(3) රතු කහ පොඩ්සොලික් පස.
(4) දියළු පස.
(5) චූර්ණමය නොවන දුඹුරු පස.

9. පස් නියැදියක අඩංගු කැටායන ප්‍රමාණ පහත වගුවේ දැක් වේ.

| අයන වර්ගය | $H^{+}$ | $K^{+}$ | $Mg^{+2}$ | $Ca^{+2}$ | $Na^{+}$ |
|---|---|---|---|---|---|
| කැටායන මිලිසමක/ පස් 100 g | 2.40 | 0.28 | 0.12 | 1.00 | 0.03 |

ඉහත සඳහන් පසේ භෂ්ම සංතෘප්ත ප්‍රතිශතය,

(1) 11% කි.
(2) 28% කි.
(3) 37% කි.
(4) 47% කි.
(5) 73% කි

10. ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ දී පසේ දැකිය හැකි, එහෙත් උපරිම ජලාකර්ෂණ සංගුණකය අවස්ථාව දක්වා පස වියලූ විට පසේ දැකිය නොහැකි ජල ආකාරය/ ආකාර වනුයේ,

(1) ගුරුත්වාකර්ෂණ ජලය ය.
(2) කේශාකර්ෂණ ජලය ය.
(3) ජලාකර්ෂණ ජලය ය.
(4) ජලාකර්ෂණ ජලය හා කේශාකර්ෂණ ජලය ය.
(5) කේශාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලය ය.

11. ශාක වර්ධනයට හා පැවැත්මට වැදගත්වන මහා මූලද්‍රව්‍යයක්, ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයක් හා උපකාරක මූලද්‍රව්‍යයක් වනුයේ පිළිවෙළින්,

(1) Ca, Fe සහ Na ය.
(2) P, I සහ Cu ය.
(3) Mn, Mg සහ I ය.
(4) Na, Ca සහ Fe ය.
(5) Mg, I සහ Mn ය.

12. කොම්පෝස්ට් නිෂ්පාදනය හා සම්බන්ධ පහත වගුවට අවධානය යොමු කරන්න.

| | පියවර | අනුගමනය කිරීමට හේතු |
|---|---|---|
| A. | අමුද්‍රව්‍ය ලෙස ගන්නා කාබනික ද්‍රව්‍ය කුඩා කැබලි බවට පත් කිරීම. | ක්ෂුද්‍රජීවීන්ට ක්‍රියාකළ හැකි පෘෂ්ඨීය ක්ෂේත්‍රඵලය වැඩි කිරීම. |
| B. | කොම්පෝස්ට් ගොඩ ආවරණ කිරීම. | කොම්පෝස්ට් ගොඩ වර්ෂාවෙන් ආරක්ෂා කිරීම. |
| C. | දිරායන කොම්පෝස්ට් ගොඩක් තුළට රිටක් ඇතුළු කිරීම. | කොම්පෝස්ට් ගොඩ මිශ්‍ර කිරීම පහසු වීම. |
| D. | කොම්පෝස්ට් ගොඩ පෙරළීම. | වාතනය දියුණු වීම හා ක්ෂුද්‍රජීවීන් සමාකාරව විසිරීම. |

ඒ අනුව පියවර සහ හේතු යන දෙකම නිවැරදි ව දක්වා ඇති පේළිය වනුයේ,

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C ය.
(4) A, B සහ D පමණි.
(5) B, C සහ D පමණි.

13. ජෛව පොහොර පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A. ශාක පෝෂක ලබා දීමේ හැකියාව වර්ධනය කළ හැකි ක්ෂුද්‍රජීවීන් අඩංගු ජීවී ද්‍රව්‍යයක් ලෙස ජෛව පොහොර හැඳින්විය හැකි ය.
B. අමු කොළ පොහොර හා ගොවිපොළ පොහොර, ජෛව පොහොර වර්ගවලට නිදසුන් ය.
C. ජෛව පොහොර නිෂ්පාදනය සඳහා ඇසොල්ලා පර්ණාංගය සුලභව යොදා ගනියි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C පමණි.
(4) A, B හා C යන සියල්ලම ය.
(5) A, B හා C ප්‍රකාශ තුනම අසත්‍ය වේ.

14. බෝග කිහිපයක් හා බෝග සංස්ථාපන ක්‍රම කිහිපයක් පහත වගුවේ දැක් වේ. ඒවා වඩාත් නිවැරදිව ගලපා ඇත්තේ,

| | බෝගය | | බෝග සංස්ථාපන ක්‍රමය |
|---|---|---|---|
| A. | අන්නාසි | E. | සමචතුරස්‍ර ක්‍රමය |
| B. | පලතුරු | F. | පංචාස්‍ර ක්‍රමය |
| C. | පොල් | G. | අහඹු ක්‍රමය |
| D. | වී | H. | දෙපේළි ක්‍රමය |

(1) AF, BE, CH, DG ය.
(2) AF, BG, CH, DE ය.
(3) AG, BE, CF, DH ය.
(4) AG, BF, CH, DE ය.
(5) AH, BF, CE, DG ය.

15. බිම් සැකසීමේ උපකරණ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

A. යටිපස බුරුල් කරන උපකරණය (Sub soiler) ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.
B. රොටවේටරය මගින් විශාල පස් පිඩැලි කුඩා කොටස්වලට කඩනු ලැබේ.
C. ජපන් රොටරි වීඩරය යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.

(1) A පමණි.
(2) B පමණි.
(3) A සහ B පමණි.
(4) A සහ C පමණි.
(5) B සහ C පමණි.

16. ගොවිමහතෙකු තම වගා භූමිය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක් වේ.

A. පසට අළුහුණු එකතු කිරීම.
B. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම.
C. සමෝච්ඡ කානු කැපීම.
D. පස මතුපිට ආවරණ බෝග වගා කිරීම.

ඒවා අතරින් වර්ෂා ජලය මතුපිට අපදාවයෙන් ආරක්ෂා කර ගැනීමට ඉවහල්වන ක්‍රියාකාරකම් වනුයේ,

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C පමණි.
(4) A, B සහ D පමණි.
(5) B, C සහ D පමණි.

17. විස්ථාපන ජල පොම්ප හා සැසඳීමේ දී, කේන්ද්‍රාපසාරී ජල පොම්පවල වාසියක් ලෙස සැලකිය හැක්කේ එහි,

(1) ශක්තිමත් බව හා කල්පැවැත්ම වැඩි වීම යි.
(2) මූලික වියදම අඩු වීම යි.
(3) මඩ හා වැලි සහිත ජලය වුවද පොම්ප කළ හැකි වීම යි.
(4) ඉහළ උසකට ජලය පහසුවෙන් පොම්ප කළ හැකි වීම යි.
(5) ඉන්ධන සඳහා වැඩි පිරිවැයක් වැය නොවීම යි.

18. කිසියම් ක්ෂේත්‍රයක වගා කරන ලද මුං වගාවක් සඳහා සතියකට අවශ්‍ය ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව 18 cm ක් ලෙස ගණනය කර ඇති අතර, එම ක්ෂේත්‍රයේ ජල සම්පාදන කාර්යක්ෂමතාව 75% කි. මෙම වගාව සඳහා සැපයිය යුතු දළ ජල සම්පාදන අවශ්‍යතාව කොපමණ ද?

(1) 13.5 cm
(2) 16 cm
(3) 18 cm
(4) 20 cm
(5) 24 cm

19. ශාකවල ජ්ලෝයමීය පරිසංක්‍රමණය යාමනය කිරීමෙන් අපේක්ෂා කරනුයේ,

(1) අතු කැබලිවල මුල් අද්දවා ගැනීම ය
(2) පුෂ්පීකරණය උත්තේජනය කිරීම ය.
(3) කැපූ මල්, අතු කල් තබා ගැනීම ය.
(4) පටක රෝපණය සාර්ථක කර ගැනීම ය.
(5) ශාක බද්ධ සාර්ථක කර ගැනීම ය.

20. මහා පරිමාණ ලෙස කොළ ගෝවා වගා කරන ගොවියෙකුට, ගෝවා පත්‍ර විශාල කර ගැනීම සඳහා යෙදිය හැකි ශාක හෝමෝන කාණ්ඩයක් වන්නේ,

(1) ගිබෙරලින් ය.
(2) එතිලීන් ය.
(3) සයිටොකයිනීන් ය.
(4) ඔක්සින් ය.
(5) ඇබ්සිසික් අම්ලය ය.

21. ස්වාභාවිකව, පුෂ්පවල පරාගනය ස්වපරාගනය සහ පරපරාගනය යන ආකාර දෙකට ම සිදු වේ. මෙම ආකාර දෙකට ම පරාගනය වන බෝග සඳහා උදාහරණයක් වන්නේ,

(1) වී හා තක්කාලි ය.
(2) මෑ හා කඩල ය.
(3) බඩඉරිඟු හා රාබු ය.
(4) කරවිල හා මෑ ය.
(5) වම්බටු හා තම්පලා ය.

22. බීජවල ජීව්‍යතාව කෙරෙහි බලපාන සාධක පිළිබඳව ගොවි මහතෙකු විසින් දැක් වූ අදහස් කිහිපයක් පහත දැක් වේ.

A. අධික උෂ්ණත්වය සහිත පරිසරයක බීජ ගබඩා කර තැබීමෙන් බීජයේ ජීව්‍යතාවට හානි සිදු වේ.
B. ගබඩා පරිසරයේ $CO_2$ සාන්ද්‍රණය වැඩි කිරීමෙන් බීජවල ජීව්‍යතාව වැඩි කර ගත හැකි ය.
C. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව හා බීජවල ජීව්‍යතාව අතර සම්බන්ධයක් නොමැත.
D. ක්ෂුද්‍රජීවීන්ගෙන් පිටවන පරිවෘත්තීය ඵල හේතුකොටගෙන බීජවල ජීව්‍යතාව අඩු වේ.

මෙම ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) B හා D පමණි.
(4) A, B හා C පමණි.
(5) A, B හා D පමණි.

23. බීජවල සුප්තතාව ඉවත් කිරීමේ පරීක්ෂණයක දී, සිසුන් පිරිසක් ජීවී බීජ වර්ග කිහිපයකට සිදු කරන ලද ප්‍රතිකාර කිහිපයක් පහත දක්වා ඇත.

| | ප්‍රතිකාරය | බීජ වර්ග |
|---|---|---|
| A. | බීජාවරණය පිපිරවීම. | කරවිල, වැටකොළු |
| B. | බීජාවරණය සීරීම. | තේක්ක, සියඹලා |
| C. | බීජාවරණය ඉවත් කිරීම. | අඹ, දෙහි |
| D. | උණු ජල ප්‍රතිකාර කිරීම. | දඹල, වී |

මෙහිදී වඩාත් සාර්ථක බීජ ප්‍රරෝහණයක් අපේක්ෂා කළ හැකි ප්‍රතිකාරය/ ප්‍රතිකාර වනුයේ,

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ලම ය.

24. "Blotter ක්‍රමය" භාවිතයෙන් දිලීර මගින් ආසාදිත වී බීජ හඳුනා ගැනීමේ පරීක්ෂණයක දී පහත රූපයේ පරිදි කොනීඩි බීජාණු දක්නට ලැබුණි. මෙම ආසාදිත දිලීරය විය හැක්කේ,



(1) *Pyricularia cladosporium* ය.
(2) *Pyricularia cannicola* ය.
(3) *Pyricularia apiculata* ය.
(4) *Pyricularia oryzae* ය.
(5) *Pyricularia lauri* ය.

25. පහත වගුවෙහි දක්වා ඇත්තේ සහතික කළ බීජ නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ පියවර සිදු කරන ස්ථාන වේ.

| | ක්‍රියාවලිය | සිදුකරන ස්ථාන/ ස්ථානය |
|---|---|---|
| A. | අභිජනන බීජ නිෂ්පාදනය | අභිජනන පර්යේෂණ මධ්‍යස්ථාන හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපොළවල ය. |
| B. | අත්තිවාරම් බීජ නිෂ්පාදනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපොළවල පමණි. |
| C. | ලියාපදිංචි බීජ නිෂ්පාදනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපොළවල පමණි. |
| D. | සහතික කළ බීජ නිෂ්පාදනය | රජයේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික ගොවිපොළවල පමණි. |

ඒ අනුව ක්‍රියාවලිය හා ස්ථානය / ස්ථාන නිවැරදිව දක්වා ඇති පේළිය/ පේළි වනුයේ,

(1) A පමණි. (2) B පමණි.
(3) A සහ B පමණි. (4) A සහ D පමණි.
(5) A, B සහ C පමණි.

26. බෝග අස්වනුවල ප්‍රමාණාත්මකබව හා ගුණාත්මකබව වැඩි කිරීම සඳහා නව ප්‍රවේණිදර්ශ සහිත ශාක අභිජනනය කිරීම අත්‍යවශ්‍ය වී ඇත. මෑතක දී එසේ වියළි කලාපය සඳහා හඳුන්වා දුන් ගොවීන් අතර වඩාත් ජනප්‍රිය වූ අඹ ප්‍රභේදය වන්නේ,
(1) ටොම් EJC ය.
(2) දම්පර ය.
(3) පීටර් පසාන්ඩ් ය.
(4) කර්තකොලොම්බන් ය.
(5) විලාඩ් ය.

27. සූර්ය ප්‍රචාරක ව්‍යුහ සම්බන්ධයෙන් සිසුවෙකු ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A. සූර්ය ප්‍රචාරක සෑදීම සඳහා ආලෝකය ගමන් කළ හැකි පොලිතීන් බහුලව යොදා ගනියි.
B. සූර්ය ප්‍රචාරක තුළ සිටුවන ලද දඬු කැබලිවල ප්‍රභාසංස්ලේෂණය මනා ව සිදු වේ.
C. සූර්ය ප්‍රචාරක තුළ උෂ්ණත්වය හා ආර්ද්‍රතාව බාහිර පරිසරයට වඩා අඩු වේ.
D. අවශ්‍යතාව අනුව විවිධ ආකාරයේ සූර්ය ප්‍රචාරක ව්‍යුහ සාදා ගත හැකි ය.

මෙම ප්‍රකාශ අතරින් සත්‍ය වගන්තිය/ සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A, B සහ C පමණි. (5) A, B සහ D පමණි.

28. නිර්පාංශු වගාව සම්බන්ධයෙන් පහත ප්‍රකාශ පිළිබඳව අවධානය යොමු කරන්න.

A. යොදා ගනු ලබන පෝෂණ මාධ්‍යයෙහි pH හා EC අගයයන් නියමිත පරාසවල පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.
B. නිර්පාංශු වගාවේ වගා මාධ්‍ය ලෙස ද්‍රව හෝ ඝන මාධ්‍ය පමණක් යොදා ගැනේ.
C. ගැඹුරු පෝෂක ධාරා තාක්ෂණය යටතේ නිර්පාංශු වගාවේ දී වගා මාධ්‍ය ලෙස කොහුබත් හෝ කාබනීකෘත දහයියා යොදා ගැනේ.
D. ඝන මාධ්‍ය තුළ බෝග වගාව සඳහා අලුත් කොහුබත් යොදා ගැනීම අහිතකර ය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) A, C සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ලම ය.

29. පාසල් ගෙවත්තේ සිදු කළ පරීක්ෂාවක දී පහත සඳහන් ලක්ෂණ නිරීක්ෂණය කළ හැකි විය.

A. පතෝල පත්‍රවල තැනින් තැන සිදුරු කර තිබීම
B. වම්බටු පත්‍ර දැලක් සේ දිස්වන පරිදි, නාරටි අතර පමණක් කා දමා තිබීම
C. මෑ කරල් හා විකෘති වූ ළපටි පත්‍ර මත කුඩා කෘමි විශේෂයක් සිටීම
D. විකෘති වූ කරවිල කරල් කපා බැලූ විට, නලියන සුදු කීටයන් සමූහයක් දැකිය හැකි වීම
E. වම්බටු ශාකයේ ළපටි රිකිළි මැළවී තිබූ අතර, ළපටි කඳේ තැනින් තැන සිදුරු දැකිය හැකි වීම

ඉහත සඳහන් හානි පමුණුවන පළිබෝධ කෘමීන් නිවැරදි ව දක්වා ඇත්තේ පහත වගුවේ කුමන පේළියෙහිද?

| | නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|
| | A | B | C | D | E |
| (1) | අවුලකපෝරා | කුඩිත්තා | එල හා රිකිලි විදින්නා | එපිලැක්නා | එල හා රිකිලි විදින්නා |
| (2) | අවුලකපෝරා | එපිලැක්නා | කුඩිත්තා | ඉල් මැස්සා | එල හා රිකිලි විදින්නා |
| (3) | එපිලැක්නා | මයිටාවන් | කුඩිත්තා | පිටි මකුණා | පතංගයා |
| (4) | එපිලැක්නා | අවුලකපෝරා | බෝංචි මැස්සා | ඉල් මැස්සා | පතංගයා |
| (5) | කුඩිත්තා | එපිලැක්නා | එල හා රිකිලි විදින්නා | ඉල් මැස්සා | මයිටාවන් |

30. වල් පැළෑටි සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශයක් වනුයේ,
(1) ආක්‍රමණශීලී වල්පැළෑටි ජෛව විවිධත්වය කෙරෙහි බලපෑම් ඇති කරයි.
(2) ඇටවරා යනු පත් වර්ගයට අයත් වල් පැළෑටියකි.
(3) වී වගාවේ වල් මර්දනයට ජලයෙන් යට කිරීම බහුලව යොදා ගැනේ.
(4) ගඳපාන යනු ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටියකි.
(5) කලාඳුරු, ඇටවරා ආදී වල්පැළ මර්දනයට පරිසංක්‍රමණ වල්නාශක භාවිත කළ හැකි ය.

31. පාසල් ගෙවත්තේ වගා කර තිබූ වම්බටු වගාවක පැළ කිහිපයක් මැළවී තිබුණි. එම ශාක ගලවා බැලූ විට මුල් කුණු වී තිබුණු අතර ආසාදිත ශාකයේ කඳ කොටසක් කපා පිරිසිදු ජලය සහිත විනිවිද පෙනෙන බඳුනකට දමා තැබූ විට එයින් සුදු පැහැ ශ්‍රාවයක් පිට විය. මෙය කුමන ආසාදනයක් විය හැකි ද?
(1) බැක්ටීරියා (2) වෛරස් (3) දිලීර
(4) නෙමටෝඩා (5) පයිටොප්ලාස්මා

32. $LD_{50}$ අගය 50 mg/kg වන කෘමිනාශකයක් පිළිබඳව ශිෂ්‍යයින් පිරිසක් ප්‍රකාශ කළ අදහස් කිහිපයක් පහත දැක් වේ,
A. එය එළවලු, පලතුරු, පලා වර්ගවලට යෙදීමට වඩාත් සුදුසු ය.
B. එය ඉතා උග්‍ර විෂ සහිත ය.
C. එය අඩංගු බෝතලයේ රතු පැහැති වර්ණ තීරුවක් තිබිය යුතු ය.
D. ඉලක්කගත සත්ත්ව ගහනය මුළුමනින්ම විනාශ කිරීමට මෙම කෘමිනාශකයෙන් අවශ්‍ය ප්‍රමාණය ජීව බර කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් 50 කි.

මේ අතරින් නිවැරදි වන්නේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) A සහ C පමණි.
(4) C සහ D පමණි (5) A, B සහ D පමණි.

33. පසෙන් බෝවන ශාක රෝගයක් වන්නේ,
(1) රබර් සුදු මුල් රෝගය යි. (2) කෝපි මලකඩ රෝගය යි.
(3) මිරිස් කොළ කොඩවීමේ රෝගය යි. (4) සෝගම් ඇට දුඹුල් රෝගය යි.
(5) තේ බිබිලි රෝගය යි.

34. ආහාර නිෂ්පාදන ක්‍රියාදාමයේ එක් අවස්ථාවක් වන, ගොවිබිමේ සිට කර්මාන්තශාලාව වෙත අස්වනු රැගෙන ඒම දක්වා ක්‍රියාවලිවල දී එම අස්වනුවලට අහිතකර ද්‍රව්‍ය එකතුවීම වැළැක්වීම සඳහා ලබා දෙන ප්‍රමිති සහතිකය කෙටියෙන් හඳුන්වන්නේ,
(1) HACCP ලෙස ය. (2) GMP ලෙස ය. (3) GAP ලෙස ය.
(4) SLS ලෙස ය. (5) ISO ලෙස ය.

35. ආහාර පරිරක්ෂණය පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) ශීතනයේ දී ආහාරයේ පවතින ස්වභාවික එන්සයිම විනාශ වේ.
(2) තාපය මගින් ජීවාණුහරණය කිරීමේ දී ආහාරයක රසය මෙන්ම වර්ණය ද වෙනස් විය හැකි ය.
(3) පැස්ටරීකරණයේ දී ආහාරයේ සිටින සියලුම ක්ෂුද්‍රජීවීන් හා බීජාණු විනාශ වේ.
(4) ප්‍රවිකිරණයේ දී ආහාරයේ ජල සක්‍රියතාවය පහත හෙළීම මගින් ක්ෂුද්‍රජීවී ක්‍රියා නිශේධනය කරයි.
(5) පැසවීමේ දී ආහාරයේ වර්ණය හා වයනය වෙනස් වුව ද ස්වාද පැතිකඩ වෙනස් නොවේ.

36. ආහාර පිළිබඳව නිරීක්ෂණය කරන ලද සංසිද්ධි කිහිපයක් හා ඊට හේතු වගුවෙහි දැක් වේ.

| සංසිද්ධිය | හේතුව |
|---|---|
| A. කපන ලද ඇපල් ගෙඩිවල කැපුම් පෘෂ්ඨ දුඹුරු පැහැ වීම. | මෙලාඩ් ප්‍රතික්‍රියාව සිදු වීම |
| B. බටර් මුඩු රස වීම | අසංතෘප්ත මේද අම්ල ඔක්සිකරණය වීම |
| C. සහල් සේදූ ජලය අළු පැහැ වීම | දිලීර වර්ධනය වීම |

ඉහත සංසිද්ධිය සහ හේතුව නිවැරදිව දක්වා ඇත්තේ,

(1) A හි පමණි.
(2) B හි පමණි.
(3) C හි පමණි.
(4) A සහ B හි පමණි.
(5) B සහ C හි පමණි.

37. ආහාර විවිධාංගීකරණය මගින් අත්වන ප්‍රතිලාභ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A. නව මුහුණුවරකින් ආහාරය වෙළඳපොළට ඉදිරිපත් කළ හැකි වීම
B. ආහාර අපතේ යාම අවම කර ගත හැකි වීම
C. ආහාරයේ පෝෂණීය අගය වැඩි වීම

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම සත්‍ය වේ.

38. ඵල ඉදීමේ දී ආන්ත උපරිමය පෙන්වන පලතුරු (Climacteric fruits) පමණක් අඩංගු වන පිළිතුර කුමක්ද?

(1) අඹ, අන්නාසි, ඇපල්, කෙසෙල් සහ පෙයාර්ස්
(2) අඹ, අන්නාසි, ඇපල්, කෙසෙල් සහ මිදි
(3) අඹ, ඇපල්, කෙසෙල්, පැපොල්, සහ පෙයාර්ස්
(4) අන්නාසි, දොඩම්, මිදි, ස්ට්‍රෝබෙරි සහ චෙරි
(5) ඇපල්, මිදි, ස්ට්‍රෝබෙරි, පෙයාර්ස්, සහ චෙරි

39. බෝග අස්වනුවල පරිණත දර්ශකය නිර්ණය කරනු ලබන කායික විද්‍යාත්මක ක්‍රමයක් වන්නේ,

(1) නිෂ්පාදනය වන එතිලීන් ප්‍රමාණය මැනීම යි. (2) දෘඪතාව මැනීම යි.
(3) විශිෂ්ඨ ගුරුත්වය සෙවීම යි. (4) බ්‍රික්ස් අගය මැනීම යි.
(5) දෘෂ්‍යී පරීක්ෂාව සිදු කිරීම යි.

40. එළකිරිවල සංයුතිය පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) කිරිවල අඩංගු ප්‍රෝටීනය ඇල්බියුමින් ය.
(2) කිරිවල වර්ණයට හේතුව කැරොටීන් ය.
(3) කිරිවල මේදය වැඩි වශයෙන් පවතින්නේ අසංතෘප්ත මේදය වශයෙනි.
(4) කිරිවල අඩංගු මේද ප්‍රතිශතය 10% ක් පමණ වේ.
(5) කැල්සියම් හා පොස්පරස් කිරිවල අඩංගු ප්‍රධාන ඛනිජ වේ.

41. එළදෙනකගේ කිරි ස්‍රාවය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන හෝමෝනය වනුයේ,

(1) ලුටෙනීකාරක හෝමෝනය යි.
(2) ඊස්ට්‍රජන් හෝමෝනය යි.
(3) ස්‍යුනිකා උත්තේජක හෝමෝනය යි.
(4) ඇඩ්‍රිනලින් හෝමෝනය යි.
(5) ප්‍රෝලැක්ටින් හෝමෝනය යි.

42. සතුන්ගෙන් මිනිසාට බෝ වන රෝගයක් වන්නේ,

(1) රැනිකට් ය.
(2) කුරුළු උණ ය.
(3) ගම්බෝරෝ ය.
(4) කොක්සිඩියෝසිස් ය.
(5) පුල්ලෝරම් ය.

43. 2018 වසරේ එක්තරා කාලසීමාවක දී, ශ්‍රී ලංකාවේ පොල් ගෙඩි සඳහා වන ඉල්ලුම් වක්‍රය පහත රූපයේ දක්වා ඇති පරිදි D සිට $D_1$ දක්වා විතැන් විය. එසේ විතැන් වීමට හේතුවක් විය හැක්කේ,

(1) පැකට් කළ පොල් කිරිවල මිල අඩුවීම ය.
(2) පැකට් කළ පොල් කිරිවල මිල වැඩිවීම ය.
(3) පොල් ගෙඩිවල මිල අඩු වේ යැයි පුවත්පතක ලිපියක් පලවීම ය.
(4) පොල් සඳහා පාරිභෝගික රුචිය අඩු වීම ය.
(5) පාරිභෝගිකයාගේ ආදායම අඩු වීම ය.




44. කෘෂිකාර්මික භාණ්ඩවල ඉල්ලුමේ ස්වභාවය නිරූපණය කෙරෙන නිවැරදි ප්‍රස්ථාරය කුමක්ද?



(1)



(2)



(3)



(4)



(5)

45. පූර්ණ තරගකාරී වෙළඳපොල තත්ත්වයක දී,

(1) සැපයුම්කරුට මිල තීරණය කළ හැකි ය.
(2) සැපයුම්කරුවන් කිහිපදෙනෙක් සිටිති.
(3) වෙළඳපොලට පිවිසීමට හෝ පිටවීමට බාධා නොමැත.
(4) භාණ්ඩ අතර ප්‍රභේදනයක් ඇත.
(6) එක නිෂ්පාදකයෙකුට වෙළඳපොල මත විශාල බලපෑමක් කළ හැකි ය.

46. කෘෂි නිෂ්පාදනයක් සඳහා පොහොර හා ශ්‍රමය යන යෙදවුම් භාවිත කළ හැකි ආකාර පහත ප්‍රස්ථාරයෙන් දැක් වේ. ඒ සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.




(1) X වක්‍රයට වඩා වැඩි නිෂ්පාදන මට්ටමක් Y වක්‍රය මගින් දක්වයි.
(2) මෙම වක්‍ර මගින් නිෂ්පාදන සාධක දෙකක් ආදේශ කිරීමේ හැකියාව පෙන්වයි.
(3) X වක්‍රයේ පහළට යන විට නිෂ්පාදනය අඩු වේ.
(4) Y වක්‍රයේ දැක්වෙන නිෂ්පාදන මට්ටම ලබා ගැනීමට X නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම්වලට වඩා වැඩි යෙදවුම් ප්‍රමාණයක් අවශ්‍ය වේ.
(5) Y වක්‍රයේ සෑම ලක්ෂයකින්ම සමාන නිෂ්පාදන මට්ටමක් නිරූපනය කරයි.

47. කුකුළු පාලනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A. බිත්තර දමන කිකිළියන් පාලනයේ දී ඝන ආස්තරණ ක්‍රමය බහුලව යොදා ගැනේ.

B. දිනක් වයසැති කුකුළු පැටවුන්ට කුකුළු වසූරිය සඳහා පළමු එන්නත ලබා දෙනු ලැබේ.

C. ආහාර සලාකයේ කැල්සියම් හිඟ වීම නිසා සැව් බිත්තර ඇති වේ.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

48. පරිසර උෂ්ණත්වය වැඩිවීමත් සමග,

(1) ගොවිපොළ සතුන්ගේ ආහාර හා ජල ආගනුව අඩු වේ.
(2) ගවයින්ගේ ශුක්‍රවල ගුණාත්මකභාවය වැඩි වේ.
(3) ගවයින්ගේ මද ලක්ෂණ පෙන්වීම පැහැදිලි වේ.
(4) ගොවිපොළ සතුන්ගේ රෝගවලට ග්‍රාහීතාව අඩු වේ.
(5) කිරිදෙනුන්ගේ සඵලතාව අඩු වේ.

49. රෝමාන්තිකයෙකුගේ ආහාර මාර්ගයේ කොටස් නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙකු තම ක්ෂේත්‍ර පොතේ පහත දැක්වෙන සටහන් තබා ගන්නා ලදී.
A ව්‍යුහයේ අභ්‍යන්තර බිත්තියේ තුවායක වුල් මෙන් ඇඹිලි ආකාර ශ්ලේෂ්මය නෙරුම් පිහිටා තිබුණි.
B ව්‍යුහයේ අභ්‍යන්තර බිත්තියේ පිටිකා නොමැති අතර මී වදයක හැඩැති ෂඩාශ්‍රාකාර ව්‍යුහ පිහිටයි.
C ව්‍යුහය පොතක පිටු ආකාරයේ ශ්ලේෂ්මය පටි සහිත තරමක් රවුම් හැඩැති ව්‍යුහයකි.

ශිෂ්‍යයා විසින් සටහන් කරගත් A, B සහ C ව්‍යුහ විය හැක්කේ පිළිවෙලින්,

(1) ජඨරාශය, රූමනය සහ බහුනැමිය ය.
(2) ජඨරාශය, බහුනැමිය සහ විතංශිකාව ය.
(3) විතංශිකාව, බහුනැමිය සහ රූමනය ය.
(4) රූමනය, විතංශිකාව සහ බහුනැමිය ය.
(5) රූමනය, බහුනැමිය සහ විතංශිකාව ය.

50. කෘෂිකර්මාන්තයේ දී ඇතිවිය හැකි ආපදා හා සෞඛ්‍ය ගැටලු සම්බන්ධව පහත දී ඇති වගන්ති කෙරෙහි අවධානය යොමු කරන්න.
A. වියළි කලාපයේ මෝසම් වැසි කාලයට ගොවීන්ට සිදු වන සර්ප දෂ්ඨන අඩු ය.
B. ගවයින් මගින් ගොවීන්ට ක්ෂය රෝගය සංක්‍රමණය විය හැකි ය.
C. තද හිරු එළියෙහි වැඩකරනවිට, ගොවීන් විජලනය වීම කෘෂිකර්මයේ දී ඇති විය හැකි භෞතික ආපදාවකි.

මේ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ C පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C සියල්ලම ය.